# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2171/6 - 2020 අප්‍රේල් මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2020.04.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උප වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝගය මගින් 2019 දෙසැම්බර් 05 දිනැති 2152/32 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය පහත පරිදි සංශෝධනය කරමි.

(1) දෙවන ඡේදයේ (එ) උප ඡේදයට වහාම පහත දැක්වෙන උප ඡේදය එක් කිරීමෙන්

(ඒ) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කිරීමට යටත්ව ආනයනය කරනු ලබන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක උප ශීර්ෂ 90.18, 90.19, 90.20 හා 90.21යටතේ වර්ගීකරණය කර ඇති සෞඛ්‍ය උපකරණ සහ උපාංග, උප ශීර්ෂ 94.1, 94.2, 94.3 හා 94.4 යටතේ වර්ගීකරණය කර ඇති රෝහල් ගෘහ උපකරණ,

(2) මෙම නියෝගය 2020 අප්‍රේල් 16 වන දින සිට බලපැවැත්වේ.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් 16 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

07-143

1A - PG 5023 — 567 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*